ජාතික ශිෂ්‍යභට බලකාය
தேசிய மாணவச்சிப்பாய்கள் படையணி
NATIONAL CADET CORPS

අංක 15, දුටුගැමුණු වීදිය, පාමංකඩ, දෙහිවල. இல. 15, துட்டுகெமுனு வீதி, பாமன்கடை, தெஹிவளை. No.15, Dutugemunu Street, Pamankada, Dehiwala, Sri Lanka.

උපදේශ ශාඛාව
06 AUG 2025
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය "ඉසුරුපාය" බත්තරමුල්ල

ජාශිබ/පුහුණු/2 (90) 2025 අගෝස්තු මස 05 දින

ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

**ජාතික කඳවුරු සහතික පත් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය ලේකම් තුමන්ගේ අත්සන ඇතුලත් කිරීම.**

1. ජාතික ශිෂ්‍යභට බලකාය දිප ව්‍යාප්තව පාසල් වල පවත්වා ගෙන යනු ලබන ආරක්ෂක, පොලිස්, තූර්ය වාදන (පෙරදිග/අපරදිග) සහ කණිෂ්ඨ ශිෂ්‍යභට බණ්ඩ බලඇණි, පළාත් මට්ටමින් කඳවුරු ගත කොට ඉන් ඉහළම දක්ෂතා දක්වන ඉදු බාලක/බාලිකා ශිෂ්‍යභට බණ්ඩ ඇගයීම වෙනුවෙන් පවත්වනු ලබන ජාතික කඳවුරු පහත දක්වා ඇති කාල සීමාවන් තුළ පුහුණු මධ්‍යස්ථානය රංටැඹේ සහ කළුතර පොලිස් අභ්‍යාස විද්‍යාලයේ දි පැවැත්වීමට නියමිතව ඇත.

| කඳවුර | සහභාගි වන බණ්ඩ | කාලසීමාව | | සහභාගි වන ශිෂ්‍යභට සංඛ්‍යාව |
|---|---|---|---|---|
| පෙරදිග තූර්ය වාදන ජාතික කඳවුර | බාලක බණ්ඩ 30, බාලිකා බණ්ඩ 15 පුහුණු මධ්‍යස්ථානය රංටැඹේ | 2025.09.16 | 2025.09.23 | 1225 |
| අපරදිග තූර්ය වාදන ජාතික කඳවුර | බාලක බණ්ඩ 30, බාලිකා බණ්ඩ 15 පුහුණු මධ්‍යස්ථානය රංටැඹේ | 2025.09.26 | 2025.10.03 | 1225 |
| පොලිස්පති කුසලාන කඳවුර | බාලක බණ්ඩ 40, බාලිකා බණ්ඩ 20 පුහුණු මධ්‍යස්ථානය රංටැඹේ/පොලිස් විද්‍යාලය - කලුතර | 2025.10.04 | 2025.10.11 | 1600 |
| හර්මන්ලෝස් ද සොයිසා කුසලාන කඳවුර | බාලක බණ්ඩ 40, බාලිකා බණ්ඩ 20 පුහුණු මධ්‍යස්ථානය රංටැඹේ | 2025.10.12 | 2025.10.22 | 1800 |
| ජෝන් බී කල් කුසලාන කඳවුර | බාලක බණ්ඩ 40, බාලිකා බණ්ඩ 20 පුහුණු මධ්‍යස්ථානය රංටැඹේ | 2025.10.25 | 2025.11.01 | 1600 |

2. පාසල් තුළ ක්‍රියාත්මක වන විෂය බාහිර කටයුත්තක් වන ශිෂ්‍යභට ක්‍රියාකාරකම් වල නිරත බාලක/බාලිකාවන් ජාතික මට්ටමෙන් දක්වන දක්ෂතා ඇගයීම වෙනුවෙන් සහතික පත් පිරිනමන අතර, මේ වන තෙක් එම සහතික පත් වල අත්සන යොදන ලද්දේ ජාතික ශිෂ්‍යභට බලකායේ අධ්‍යක්ෂවරයා සහ ජාශිබ නිලධාරීන් ඇතුළු නිලධාරීන් විසිනි.

3. මීට පෙර අවස්ථා වල දී ජාතික මට්ටමේ ඇගයීම් කඳවුරු සඳහා ත්‍රිවිධ හමුදා සහ ජාශිබ නිලධාරීන් විසින් පරීක්ෂණ පවත්වන ලද අතර, 2025 වර්ෂයේ සිට ඉදිරියට පවත්වනු ලබන සෑම ජාතික කඳවුරයක් සඳහාම අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිතයෙකු එම ඇගයීම් ක්‍රියාවලියෙහි නිරවද්‍යතාවය අධීක්ෂණය සඳහා සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කරමි.

4. එලෙස පවත්වනු ලබන ඇගයීම් ක්‍රියාවලියෙන් අනතුරුව ශිෂ්‍යභට බාලක/බාලිකාවන් ලබා ගන්නා ලද ජයග්‍රහණ වෙනුවෙන් සහ සහභාගීත්වය වෙනුවෙන් පිරිනමනු ලබන සහතික පත් සඳහා ඉහළ වටිනාකමක් ලබා දීමේ අරමුණින් අධ්‍යාපන අමාත්‍යාංශය ලේකම් තුමන්ගේ හෝ එතුමන් විසින් නම් කරනු ලබන නියෝජිතයකුගේ අත්සන යෙදීමට අපේක්ෂා කරන අතර, එම සහතික වල ආකෘති පත්‍ර ඇමුණුම් වශයෙන් මෙම ලිපිය සමග ඉදිරි පත් කරමි.

5. කරුණු එසේ හෙයින් සහතික පත් ආකෘති පත්‍ර වල Representative අධ්‍යාපන අමාත්‍යාංශය (Ministry of Education) ලෙස සඳහන් ස්ථානය සඳහා අත්සන යෙදීම සඳහා අපේක්ෂා කරන බලයලත් නිලධාරියාගේ නම සහ තනතුර සඳහන් කොට අප වෙත දැනුම් දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

6. මේ සබැඳිව ඔබ තුමන් දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ඒපීසීආර් ප්‍රේමතිලක ආර්එස්පී යූඑස්පී එන්ඩීසී
බ්‍රිගේඩියර්
අධ්‍යක්ෂ